# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2144/67 – 2019 ඔක්තෝබර් මස 12 වැනි සෙනසුරාදා – 2019.10.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස – පළාත් සභා

## ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

### ඌව පළාත් සභාව

ඌව පළාත් ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන පත්කිරීම්

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(1) වගන්තිය යටතේ ඌව පළාත් ආණ්ඩුකාරවර මෛත්‍රී ගුණරත්න වන මා විසින්, පහත සඳහන් පත්කිරීම් සිදු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරිණී, ඩී. එම්. විනිතා දිසානායක මහත්මිය, 2019.08.20 වන දින සිට ඌව පළාත් ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2020.08.19 වන දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට.

02. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරිණී, එස්. බී. ඒ. එම්. ඒ. එම්. ගුණවර්ධන මහත්මිය, වහාම ක්‍රියාත්මක වන පරිදි (2019.09.09 වන දින සිට) ඌව පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වශයෙන්.

03. ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්, ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය මහතා 2019.09.15 දින සිට විදේශගත වන බැවින්, එදින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි, ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම් තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

04. ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ වැඩබලන, ආර්. එම්. ටී. බී. හාතියල්දෙණිය මහතා 2019.09.15 දින සිට විදේශගත වන බැවින්, එදින සිට ඔහු නැවත දිවයිනට පැමිණෙන තෙක්, ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරි, ඩබ්ලිව්. එම්. ආනන්ද මහතා ඌව කළමනාකරණ සංවර්ධන ආයතනයේ අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ආවරණය කිරීමට.

1A – PG4697 – 57 (2019/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ විශ්‍රාමික නිලධාරිනි, ජී. ඒ. එම්. එස්. පී. අඹන්වල මහත්මිය, 2019.10.09 වන දින සිට ඌව පළාතේ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන (ද්විඩ පාසල් හැර), පළාත් පාලන, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම්, ග්‍රාමීය යටිතල පහසුකම් හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කරන තෙක් හෝ 2020.10.08 දින හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනය දක්වා පමණක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට.

**මෛත්‍රී ගුණරත්න,**
ඌව පළාත් ආණ්ඩුකාරවර.

2019 ඔක්තෝබර් මස 10 වැනි දින,
ඌව පළාත් ආණ්ඩුකාරවර කාර්යාලයේ දී ය.

10 – 1013

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.